**ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වාර්ෂික ඇස්තමේන්තුව අනුව ආදායම් වර්ගීකරණය යටතේ අංක 10.03.07.06 දරන ආදායම් සංකේතයේ වටිනාකම වූ රු.32,497,474 ක් මූල්‍ය ප්‍රකාශනවල බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් ලැබීම් ලෙස පෙන්වනු වෙනුවට බදු නොවන ආදායම් හා වෙනත් ආදායම් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන චක්‍රලේඛයේ 7(i) හා වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව අනුව බලපත්‍ර ගාස්තු ආදායම බදු ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කළ යුතුවීම. | ඉදිරි වර්ෂවලදී නිවැරදිව ඉදිරිපත් කිරීමට සටහන් කර ගෙන ඇත. |
| (ii) | දෙපාර්තමේන්තු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන වෙනත් ලැබීම් යටතේ රු.176,826,426 ක් දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය සඳහා වූ මාසික සාරාංශ අනුව දෙපාර්තමේන්තුවේ වෙනත් ආදායම් ලැබීම් එකතුව රු.188,022,375 ක් වූයෙන් රු.11,195,949 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම නිවැරදි යැයි ප්‍රකාශ කළ ද මාසික සාරාංශවලට අනුව දෙපාර්තමේන්තු ආදායම් නොවන වෙනත් ලැබීම් ගණනය කිරීම තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුවීම. | එකතු කිරීමේ දෝෂ මත මෙම වරද සිදුවී ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් යටතේ දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.639,936,960 ක් ලෙස ද ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එදිනට ශේෂය රු.644,987,568 ක් ලෙස ද දක්වා තිබුණි. ඒ අනුව රු.5,050,608 ක වෙනස්කමක් විය. එසේම භාණ්ඩාගාර පොත් අනුව වත්කම් වාර්තාවේ මුළු එකතු වටිනාකම රු.537,559,392 ක් විය. අදාළ වෙනස්කම් සම්බන්ධයෙන් | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේ දී දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීම් කර නිවැරදි වත්කම් වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවීම. | එකඟ වෙමි. ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමේදී, 2018 දෙසැම්බර් 31 දිනට ආරම්භක ශේෂය ගිණුම් ගත කර නොතිබීම නිසා භාණ්ඩාගාර පොත්වල දැක්වෙන්නේ ආරම්භක ශේෂයන් රහිත වටිනාකමයි. ACA – 6 හි දැක්වෙන වත්කම්වල වටිනාකම නිවැරදිය. ගිණුම් පිළියෙල කිරීමේදී යතුරුපැදි, හා ආරක්ෂණ උපකරණ අත්හැරීම |

| | | |
|---|---|---|
| සැසඳීම්කර නිවැරදි වත්කම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | | නිසා මෙම වරද සිදුවී ඇත. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------------- | ----------- | --------------------------------- |
| හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | පිළිතුරු ලබාදී නැත. |

**1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------------- | ----------- | --------------------------------- |
| චන්ද්‍රිකා තොරතුරු සේවා සැපයීම් ආයතනයකට ගෙවා තිබුණු රු.31,214,943 ක් සම්බන්ධයෙන් එම ආයතනය සමඟ ඇතිකර ගත් ගිවිසුම, ගෙවීම්වලට අදාල ඉන්වොයිස් පත් හා ඊට සම්බන්ධ ලියකියවිලි සහ නව සේවා සැපයීම් ආයතනයකට රු.8,089,401 ක් ගෙවීම සම්බන්ධයෙන් අදාල ටෙන්ඩර් ලියකියවිලි යනාදිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම නිසා සතුටුදායක ලෙස ඒවා සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | ගිවිසුමක් හා ඉන්වොයිසි ඉදිරිපත් කර තිබුණු බව ප්‍රකාශ කළ ද එක් ආයතනයකට අදාල ගිවිසුමක් පමණක් ඉදිරිපත් කර තිබුණු අතර සැපයුම්කරුවන් තෝරා ගැනීමට අදාල ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණු හෙයින් ගනුදෙනුවලට අදාල සම්පූර්ණ ලියිකියවිලි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුවීම. | චන්ද්‍රිකා තොරතුරු සැපයීම සඳහා අදාල වූ ගිවිසුම් හා ඉන්වොයිස් මේ සමඟ ඉදිරිපත් කරමි. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (i) VIII වැනි පරිච්ඡේදයේ 2.1 ඡේදය | අතිකාල දීමනා ලබාගැනීමට ප්‍රමාණවත් පරිදි අතිකාල වැඩ නියම වශයෙන් හා සාධාරණ වශයෙන් කර තිබේදැයි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් හෝ ඔහුගේ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් හෝ පෞද්ගලිකව සොයා බලා සෑහීමකට පත්විය යුතු අතර නියම වූ වැඩ ප්‍රමාණයක් ඉටුකෙරෙන බවටත් නිසි පරීක්ෂණ හා වාර්තා තබා ගැනීමටත් ක්‍රියාකළ යුතුය. දිස්ත්‍රික් ධීවර කාර්යාලවල අතිකාල සේවයේ යෙදුණු නිලධාරීන්ගේ අතිකාල රාජකාරි කිරීම සම්බන්ධයෙන් එසේ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 2.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව අතිකාල වැඩ පාලනය කිරීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | XXIV වැනි පරිච්ඡේදයේ 1.6 ඡේදය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.234,800 ක ණය ශේෂයක් මාස තුනක් තුල නිරවුල් කරගෙන නොතිබුණු අවස්ථාවක ස්ථාන මාරුවී ගිය දෙපාර්තමේන්තුව විසින් ස්ථාන මාරු ලබා තිබුණු දෙපාර්තමේන්තුවේ සේවය යෙදෙන බව සනාථ කරගෙන අදාල දෙපාර්තමේන්තුවට ලිඛිතව ලියා දැන්වීමෙන් පසු තුන්වන මාසයේ දී මාසික ගිණුම් සාරාංශ මඟින් ණය ශේෂයන් අයකරගත යුතුය. එසේම එය විගණකාධිපති හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. එහෙත් එසේ කටයුතු කර තිබුණු බවක් නිරීක්ෂණය නොවීය. | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6 ඡේදය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදවල ඇතුළත් විධිවිධාන ප්‍රකාර ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් අයකරගැනීමට කටයුතු කළ යුතුවීම. | ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් මාස 03ක් තුළ නිරවුල් නොකළ අවස්ථාවලදී අදාල ආයතන, දුරකථන මඟින් දැනුවත් කර නිරවුල් කර ගන්නා ලදි. මින් ඉදිරියට එම දැනුවත් කිරීම ලිඛිතව සිදුකිරීමටත් කටයුතු කරමි. |
| (iii) | XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 ඡේදය | විශ්‍රාමික නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.690,216 ක ණය ශේෂයන් වසර 3 කට වැඩි කාලයක් පුරා අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | රු.690,216 ක් වූ අයවිය යුතු ණය ශේෂයන් ගෙන් රු.486,812 ක් වූ ණය ශේෂය 2019 මැයි මස ගිණුම් සාරාංශයන් මගින් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| | | සේවය හැර ගොස් සිටි සහ වැඩ තහනම් කර ඇති නිලධාරීන් 11 දෙනෙකුගේ වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින එකතුව රු.484,216 ක ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාලවකවානු තුළ ණය මුදල් නිරවුල් කිරීම. විධිමත් පරිදි රාජකාරී ඉටු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව | ශේෂයන්ගෙන් කොටසක් කපා හැරීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති අතර එය ගිණුම්ගත කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුතු කළ යුතුවීම. | |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) මුදල් රෙගුලාසි 118 | විධිවිධානවලට අනුව භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගෙන ආදායමෙන් ආපසු ගෙවීම් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ විධිවිධානවල සඳහන් පරිදි අනුමැතිය ලබා නොගෙන රු.900,000 ගෙවීම් සිදු කර තිබුණි. | අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන තිබුණු ද මුදල් රෙගුලාසි 118 හි විධිවිධාන අනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබා ගෙන ගෙවීම් කළ යුතුවීම. | ආදායම් ගණන් දීමේ නිලධාරී අධ්‍යක්ෂ ජනරාල් බැවින් එම අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇත. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02.II | සෙනසුරාදා සහ ඉරිදා දිනවල දිස්ත්‍රික් ධීවර කාර්යාල 4 ක නිලධාරීන් විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 02.II ප්‍රකාර ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර භාවිතා කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 01 දිනැති අංක 01/2018 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය අනුව පසුගිය වසර 03 ක කාලයක් තුළ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අයකරනු ලබන ගාස්තු සංශෝධනයක් කර නොමැති නම් එම ගාස්තු සියයට 15 කින් ඉහළ දැමීමට භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය සඳහා යොමුකළ | 2018 ජනවාරි 01 දිනැති අංක 01/2018 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදයට අනුකූලව සේවා ගාස්තු සංශෝධනයක් කිරීමට භාණ්ඩාගාර ලේකම් වෙත යොමු | සේවා ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. දෙපාර්තමේන්තුවෙන් සැපයුම් ලබන සියලුම සේවාවන් නැවත සමාලෝචනය කර සේවා ගාස්තු සංශෝධනය සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.ඉතා ඉක්මනින් එම ගාස්තු ගැසට් නිවේදනය |

| | | | |
|---|---|---|---|
| | යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කළ යුතුවීම. | නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමි. |
| (ආ) | තංගල්ල දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ 2018 වර්ෂයේ මැයි මාසය සිට නොවැම්බර් මාසය දක්වා මාස 07 ක් තුළ මෙහෙයුම් බලපත්‍ර ආදායම් වාර්තා වී නොතිබුණු අතර අනෙකුත් මාස 05 තුළ ආදායම් ලැබීම රු.10,000 ත් රු.54,000 ත් අතර විය. එසේ දීර්ඝ කාලයක් ධීවර මෙහෙයුම් සිදු නොවීම හා මෙහෙයුම් ආදායම් නොලැබීම පිළිබඳව පරීක්ෂාවට ලක් කර නොතිබුණි. | වර්ෂය පුරා මෙහෙයුම් බලපත්‍ර ආදායම අයකරගෙන තිබියදී සෑම වර්ෂයකම ජනවාරි 31 දිනට පෙර බලපත්‍ර ලබාගෙන තිබීමක් අනාවරණය වී නොතිබුණු හෙයින් ආදායම් එකතු කිරීම නිවැරදිව සිදුවන බවට පරීක්ෂාවන් නිරතුරුව කළ යුතුවීම. | ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු සඳහා ධීවරයින් විසින් සෑම වර්ෂයකම ජනවාරි 31 දිනට පෙර මෙහෙයුම් බලපත්‍ර ලබා ගත යුතුය. එබැවින් වර්ෂය පුරා ආදායම් එකතුවීමක් සිදු නොවේ. |
| (ඇ) | අජීවී බෙලි කවච ප්‍රවාහන බලපත්‍ර 18 ක් නිකුත් කිරීම තුළින් 2016 වර්ෂයේ රැස්කරන ලද රු.900,000 ක මුදලක් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස වෙළඳ සංගමයක් මඟින් කරන ලද ඉල්ලීමකට අනුව ආදායමෙන් ආපසු ගෙවීම් කර තිබුණි. මෙම ආදායම් ආපසු ගෙවීමට පැහැදිලි හේතුවක් ඉදිරිපත් කර නොතිබුණි. නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පැවති සාකච්ඡා අනුව මෙම බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය වෙත පවරා ඇති බව දක්වා තිබුණි. එහෙත් වසර 2 ක් ඉකුත්වීමෙන් පසුවද, දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර ලබා නොදීම නිසා මුදල් ආපසු ගෙවා ඇති බව වාර්තා වුවද, බලපත්‍ර ලාභීන් 18 දෙනා මුදල් ගෙවූ බවට වූ කුවිතාන්සිවල මුල් පිටපත් ඉදිරිපත් කර නොතිබීම විගණනයේ දී ගැටලු සහගත විය. | වසර 2 කට කලින් නිකුත් කළ බලපත්‍ර ආදායමක් බැවින් එම ආදායම ආපසු ගෙවීම් කිරීමේ දී සාධාරණ හේතු ඇද්ද යන්න සලකා බැලිය යුතුවීම. | අජීවී බෙලි කවච ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම 2016 සැප්තැම්බර් සිට භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයට පැවරීම මත එම දිනවල අදාල බලපත්‍ර ලබාගැනීම සඳහා දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා තිබූ 18 දෙනෙකුට බලපත්‍ර නිකුත් කිරීමට නොහැකිවූ නිසා එම මුදල ආපසු ගෙවා ඇත. |

**2.2 වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විදේශීය ගමන් වියදම් සඳහා වූ මූලික ඇස්තමේන්තුව වූ රු.මිලියන 4.5 ක මුදල සියයට 133 ක ප්‍රතිශතයකින් | වර්ෂය තුළ ඉටු කළ හැකි කාර්යයන් සඳහා තාත්ත්වික මට්ටමෙන් ඇස්තමේන්තු | 2018 වර්ෂය තුල දරන ලද විදේශ වියදම් ධීවර ක්ෂේත්‍රයට අදාල සමුළු හා |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 10.5 දක්වා රු.මිලියන 6 කින් වැඩි කිරීමට හේතුව ලෙස ධීවර කටයුතු සම්බන්ධයෙන් පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් සහභාගී කරවීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු බව වාර්තා කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීම තාත්වික මට්ටමින් සිදුනොකරන බව නිරීක්ෂණය විය. | පිළියෙල කළ යුතුවීම.<br><br>අතාත්ත්වික ඇස්තමේන්තු මඟින් ජාතික අයවැයට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානයක් යොමු කළ යුතුවීම. | සම්මන්ත්‍රණ වලට අදාල වේ. |
| (ආ) | 2018 ජනවාරි මස පරිපූරක අයවැය ඇස්තමේන්තු මඟින් ලබාගත්, 2018 වාර්ෂික ක්‍රියාකාරි සැලසුමෙහි ද ඇතුළත් කර නොතිබුණු ධීවර කර්මාන්තයේ නවීන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන්කර තිබුණු අංක 290-01-07-2506 දරන වැය විෂයය යටතේ වූ රු.මිලියන 243 ක මුළු මුදලම ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීම ද සිදුනොකර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | වර්ෂය තුළ ඉටු කළ හැකි කාර්යයන් සඳහා පමණක් තාත්ත්වික මට්ටමෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම. | 2018 අය වැය යෝජනා මගින් වෙන් කරන ලද රු.මිලියන 243 ක මුදලින් අඩි 55 ට වැඩි බහු දින ධීවර යාත්‍රා සියයට 50 ක සහනාධාර ක්‍රමයක් යටතේ ධීවරයන් හට ලබා දීමට වෙන්වී ඇත. මෙහි ප්‍රසම්පාදන කටයුතු කර යාත්‍රා 5 ක් මිලදී ගැනීමට කැබිනට් අනුමැතියට ඉදිරිපත් කළද 2018 වර්ෂයේ අග භාගයේ සිදු වූ දේශපාලනික පරිවර්තනය හේතුවෙන් කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම මත එම මිලදී ගැනීම් සිදු කිරීමට නොහැකි විය. |
| (ඇ) | අංක 290-01-01-2103 දරන යන්ත්‍ර උපකරණ අත්පත් කරගැනීම් වැය විෂයයට මුල් ප්‍රතිපාදන යටතේ රු.මිලියන 2 ක් වෙන්කර තිබිය දී මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් තවත් රු.මිලියන 11.401 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණ ද රු.මිලියන 13.401 ක් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | අතාත්ත්වික ඇස්තමේන්තු මඟින් ජාතික අයවැයට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානයක් යොමු කිරීම. | සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන සඳහා ගුවන් විදුලි යන්ත්‍ර මිලදි ගැනීම වෙනුවෙන් බිල්පත් නිවැරදි කිරීමට අක් මුදල් නොලැබීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව 2018 වර්ෂයේ ගෙවීම් කිරීමට අවශ්‍ය නොවන ඊළඟ වර්ෂය වෙනුවෙන් ගෙවීම් කළයුතු වියදම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iv) යටතේ පෙන්විය යුතු වුවත් 2018 වර්ෂයේ ඉතිරිවීම් ඉක්මවා පවතින ගෙවීම් සඳහා ඇති බැරකම් මෙම සටහන යටතේ පෙන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 94(2) හා (3) ප්‍රකාරව ඊළඟ වර්ෂය වෙනුවෙන් ගෙවීම් කළයුතු වියදම් බැරකම් යටතේ පෙන්නුම් කළ යුතුවීම. | එකඟ වෙමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු මගහරවා ගැනීමට අදාළ නිළධාරින්ට උපදෙස් දෙන ලදී. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති අතිකාල දීමනා බැරකම රු. මිලියන 2.54 ක් වූ අතර එම වැය විෂයයේ ප්‍රතිපාදන ඉතිරිය රු.395 ක් පමණක් විය. ඒ අනුව ප්‍රතිපාදන පිළිබඳ සැලකිල්ලක් නොදක්වා අතිකාල ගෙවීම සඳහා රාජකාරි පවරා ඇති බව නිරීක්ෂණය විය. | ලැබී ඇති ප්‍රතිපාදන සීමා මත කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු රැසක් පවතින බැවින් දෛනික රාජකාරි සඳහා නිලධාරින් අතිකාල සේවයේ යොදවා ගැනීම පාලනය කිරීම අසීරු වී ඇත. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ගමන් වියදම් සඳහා ගෙවීමට ඇති බැරකම රු.මිලියන 1.55 ක් වුවත් ප්‍රතිපාදන ඉතිරිය රු.18,431 ක් විය. මේ අනුව එම වැය විෂයය යටතේ වන ඉතිරිය පිළිබඳව සැලකිල්ලට නොගෙන දේශීය ගමන් අනුමත කර ඇති බව නිරීක්ෂණය විය. | තාත්ත්වික මට්ටමෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමක් හෝ වාර්ෂික ප්‍රතිපාදන ඇතුළත දේශීය ගමන් වියදම් ගෙවීමට කටයුතු කිරීමක් හෝ කළ යුතුවීම. | 2018 වර්ෂයේ අගෝස්තු මස සිට ගමන් වියදම් දීමනා වැඩි කිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. දීප ව්‍යාප්තව කාර්යාල පිහිටා තිබීම සහ අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා නිතර ගමන්වලට සහභාගි වීමට සිදුවීම නිසා මෙම තත්වය උද්ගත වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.මිලියන 195.4 ක් වැය කරමින් මිලදී ගෙන තිබුණු විද්‍යුත් ටැබ්ලට් 2428 ක් ධීවරයින් හා වරාය නිලධාරීන් වෙත නොමිලේ ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම | අදාළ උපරණ අවභාවිතය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර ඒවා ලබාදීම සහ | සියයට සියයක් සියලු ධීවරයින් විසින්ම ක්‍රියාත්මක කරනු ඇතැයි සිතිය නොහැක. නොමිලේ ලබාදෙන මෙම යන්ත්‍ර වසර 2 කින් |

| | | |
|---|---|---|
| විද්‍යුත් ටැබ්ලට් මිලදී ගැනීමේ අරමුණ වූ එතෙක් පැවති ලොග් පොත් ක්‍රමය වෙනුවට විද්‍යුත් ටැබ්ලට් භාවිතයට ගැනීම සාර්ථකව සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පසුවිපරම් කටයුතු සිදුකළ යුතු වීම. | හෝ 3 කින් ක්‍රියාවිරහිත වීම හෝ භාවිතා කළ නොහැකි පරිදි වෙනස්වීම් සිදුවිය හැක. එසේ වූ විට ධීවරයා විසින්ම නව යන්ත්‍රයක් මිලදී ගත යුතුය. ඉතා සුළු ප්‍රතිශතයකින් හෝ ඉලෙක්ට්‍රෝනික ටැබ් ක්‍රමවේදය ක්‍රියාත්මක වන්නේනම් වාසි සහගත වනු ඇත. |

**3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 සැප්තැම්බර් 28 දින ආරම්භ කරන ලද යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත්තුවේ 2019 පෙබරවාරි 27 දිනට විචලතා හා අතිරේක වැඩ සමඟ සමුච්චිත කළවැඩ වටිනාකම රු.මිලියන 76.23 ක් වූ අතර තවදුරටත් කළයුතු වැඩ ප්‍රමාණය රු.මිලියන 86.15 ක් හෙවත් මුළු කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 53 ක් විය. ඒ අනුව ඉදිකිරීමට අදාලව ගිවිසුම්ගත කාලය ඉක්මවා දින 261 ක් ගත කර ඇතත් වැඩ අවසන් කර නොතිබුණි. | ගිවිසුම අනුව නියමිත කාලවකවානු තුල අදාල කොන්ත්‍රාතුවේ වැඩ අවසන් කර අපේක්ෂිත පරිදි පරිහරණයට ගැනීම. | එකඟ වෙමි. ගොඩනැගිල්ලේ මූලික ඇස්තමේන්තුව හා සැලැස්ම වෙනස් වීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. |
| (ආ) මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් නිර්මාණය සඳහා නාරා ආයතනයට රු.මිලියන 1.37 ක් ගෙවා ඇතත්, ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත වූ දිනය ඉක්මවා වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් එම කාර්යය ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | නියමිත කාලය තුළ මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් නිර්මාණ ව්‍යාපෘතිය අවසන් කර අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම. | 2019 මැයි මස වනවිට එහි මූලික උපාංගය සාදා නිමකර ඇති බවත් අවශ්‍ය නැංගුරම පමණක් සාදා නිමකර නොමැති බවත් මෙම වසර අවසන් වීමට පෙර ව්‍යාපෘතිය අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වා ඇත. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කළ යුතු වුවත්,

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2019 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සඳහා 2018 වර්ෂය සඳහා විදේශාධාර ප්‍රදානය යටතේ වෙන් කරන ලද රු.මිලියන 2.1 ක ප්‍රතිපාදනවලින් 2017 වර්ෂයේ පැවැත්වූ වැඩසටහන්වලට අදාල බිල්පත් පියවීමට රු.මිලියන 1.9 ක් වැය කර තිබුණි. | වෙන්කරන ලද ප්‍රතිපාදන එම වර්ෂයට අදාල කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත යුතුවීම. | මෙම විදේශ ආධාර ප්‍රදානය සිදු කරන ලද්දේ 2017 වසරේ වන අතර එම කාර්යය එම වසර තුලම සිදු කළ යුතු විය. මේ සඳහා වැය ශිර්ෂය ලබා ගැනීමට දිගින් දිගටම මහා භාණ්ඩාගාරය සමඟ ලිපි ගනුදෙනු කළද වැය ශිර්ෂයක් ලබා දුන්නේ 2018 වසරේදීය. එබැවින් එම කටයුතු සඳහා භාණ්ඩාගාර නිළධාරින්ගේ වාචික උපදෙස් මත අත්තිකාරමක් ලබා දෙන ලදී. |

**3.5 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දීර්ඝ කිරීමේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 100 ක් ඉක්මවන්නේ නම් එය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කළ යුතු බව දැක්වේ. එහෙත් රු.මිලියන 141.20 ක් වූ යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත්තුවේ රු.මිලියන 166.94 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2(ආ) මාර්ගෝපදේශය පරිදි ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුවීම. | පිළිතුරු ලබාදී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණි. | | |
| (ii) | ලංසු කැඳවීම සඳහා සකස් කර තිබූ ප්‍රමාණ පත්‍රය අනුව රු.මිලියන 166.94 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුගත වටිනාකම ලංසු ඇගයීම් කිරීමේ දී රු.මිලියන 168.13 ක් ලෙසට සංශෝධනය කර තිබුණ ද එකී සංශෝධිත ඇස්තමේන්තුව සඳහා උක්ත මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2(ආ) මාර්ගෝපදේශය පරිදි සංශෝධිත ඇස්තමේන්තුව සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුවීම. | -එම- |
| (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 ප්‍රකාරව ඍජු ඉදිකිරීම් පිරිවැය මත අසම්භාව්‍ය / භෞතික අවිනිශ්චිතතාව රු.මිලියන 8.97 ක් වියයුතු වුවත් එය රු.මිලියන 14.55 ක් ලෙස ගණනය කර දැක්වීම හේතුවෙන් උපදේශන සේවා ගාස්තු රු.මිලියන 5.58 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 මාර්ගෝපදේශය පරිදි ඍජු ඉදිකිරීම් පිරිවැය මත අසම්භාව්‍ය / භෞතික අවිනිශ්චිතතාව ගණනය කළ යුතුවීම. | -එම- |
| (iv) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 මාර්ගෝපදේශයන් ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීමේ දී හා උක්ත ඉදිකිරීම සම්බන්ධයෙන් ගෙවීම් කිරීමේ දී ගෙවිය හැකි උපරිම අවිනිශ්චිත / අසම්භාව්‍ය ප්‍රමාණය අනුව විචලනය රු.මිලියන 8.97 ක් විය යුතු වුවත් රු.මිලියන 15.93 ක් භෞතික අවිනිශ්චිතතා සඳහා ගෙවීම් කර තිබුණි. ඒ අනුව අනුමැතියකින් තොරව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව රු.මිලියන 6.95 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 මාර්ගෝපදේශ පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීමේ දී හා ගෙවීම් කිරීමේ දී භෞතික අවිනිශ්චිතතා සඳහා සියයට 10 ක ප්‍රමාණයට ගෙවීම් කළ යුතුවීම. | -එම- |
| (v) | කොන්ත්‍රාත් විචලනයක් සඳහා ගෙවීම් කිරීම 2007 ඔක්තෝබර් 03 දිනැති අංක 14 දරන අතිරේකයෙන් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව බිල්පත් සැකසීමේ නියුතු සියලුම වෘත්තිකයින් විසින් ප්‍රමාණ බිල්පත්වල සඳහන් ප්‍රමාණය වැටයීම සඳහා සියයට 5 කට වඩා ඉඩ නොදිය යුතු වේ. එසේම නියමිත පරිපාටිය අනුගමනය කරමින් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් මිලගණන් ඉහළ යාමට හේතු පාදක වන විෂය පථය වෙනස්වීම මත නිකුත් කරන විචලන නියෝග නොකළ යුතුවේ. එහෙත් මෙම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව බිල්පත්වල සඳහන් ප්‍රමාණය වැටයීම සඳහා සියයට 5 කට වඩා ඉඩ නොදිය යුතුවීම හා පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් මිලගණන් ඉහළ යාමට හේතු පාදක වන විෂය පථය වෙනස්වීම මත නිකුත් කරන විචලන නියෝග නොකළ යුතුවීම. | -එම-<br>-එම- |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුව සඳහා උපදේශන ආයතනය විසින් සේවාදායකගේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් මිලෙන් සියයට 31 හෙවත් රු.මිලියන 43.8 ක විචලනයක් වන ආකාරයට කටයුතු කර තිබුණි. එසේ තිබියදීත් 2019 ජුනි 30 දින වනවිට උපදේශන ආයතනයට රු.මිලියන 6.44 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණි. | | |
| (ආ) | 2018 පෙබරවාරි 28 දින රු.මිලියන 1.45 ක් වූ උපස්ථ සේවාදායකයක් (Backup Server) මිලදී ගැනීම. | | |
| (i) | ආයතන 4 කට ටෙන්ඩර් ලියවිලි නිකුත්කර තිබියදී ආයතන 05 කින් මිල ගණන් කැඳවූ බවට වාර්තා කර තිබුණි. | ටෙන්ඩර් ලියවිලි නිකුත් කළ බවට සාක්ෂි නිවැරදිව ගොනුගත කළ යුතුවීම. | ආයතන 4 කට පමණක් ටෙන්ඩර් ලියවිලි ලියාපදිංචි තැපැලෙන් යවා ඇත. එක් ආයතනයකට ලියවිලි අතින් භාර දී ඇත. |
| (ii) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) හා (ඇ) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂයය පිළිබඳ විශේෂඥයකු ඇතුළත් කරගෙන අවශ්‍ය අවස්ථාවන්හි විශේෂඥ උපදෙස් ලබාගැනීමේ හැකියාව ඇතත් දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 පරිදි විශේෂඥ උපදෙස් ලබාගැනීමට කටයුතු කළ යුතුවීම. | 2.8.1 පරිදි එක් සාමාජිකයෙකු දෙපාර්තමේන්තුවට පරිබාහිර ආයතනයකින් සිටිය යුතු බව හඳුනාගත් බැවින් 2017 නොවැම්බර් 30 දින එය සඳහන් කර නාරා ආයතනයේ අධ්‍යක්ෂකවරයා සභාපති ලෙස පත්කර තාක්ෂණික ඇගයීම් කමිටුව සංශෝධනය කර ඇත. |
| (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන, ප්‍රසම්පාදන ක්‍රමය හා ලංසු කැඳවීමේ ලේඛන වර්ග පිළිබඳ එකඟවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ ඒකාබද්ධ පළමු රැස්වීමක් පැවැත්විය යුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 පරිදි ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ ඒකාබද්ධ පළමු රැස්වීමක් පැවැත්විය යුතුවීම. | පිළිගනිමි. ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මෙය නිවැරදි කරගැනීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (iv) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්කරුවන් සඳහා ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 පරිදි කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමක් අත්සන් කළ යුතුවීම. | - එම - |

**3.6 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ධීවර කාර්යාල මඟින් බෙදාහැරීම සඳහා විද්‍යුත් ටැබ්ලට් 1606 ක් ධීවරයින් වෙත බෙදා දී තිබුණු අතර දිස්ත්‍රික් ධීවර කාර්යාල ගබඩාවල විද්‍යුත් ටැබ්ලට් 374 ක් ඉතිරිව පැවතුණි. එසේම දෙපාර්තමේන්තු ගබඩාවේ පැවති තොගයෙන් විද්‍යුත් ටැබ්ලට් 256 ක් දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත බෙදා දී තිබුණ ද ඒවා කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මිලදීගත් විද්‍යුත් ටැබ්ලට් උපරිමයෙන් භාවිතා කිරීමට සැලසුම් සකස් කර තිබුණු බව ප්‍රකාශ කළ ද ධීවරයින් හා නිලධාරීන් ඒවා භාවිතා නොකරන හෙයින් වැය කළ මුදලින් උපරිම ඵලදායීතාවය ලබාගැනීමට කටයුතු කළ යුතුවීම. | මිලදීගත් යන්ත්‍ර සියල්ලම උපරිමයෙන් භාවිතා කිරීමට සැලසුම් සකස් කර මේ වන විට එම සැලසුම් සාර්ථකව ක්‍රියාවේ යෙදවමින් පවතී. |

**3.7 අනාර්ථික ගනුදෙනු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය තුළ තැන්පත් ගිණුම මඟින් චන්ද්‍රිකා ගාස්තු ලෙස අයකරගත් රු.මිලියන 18.81 ක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. එසේම එම ආයතනයට තවත් රු.මිලියන 12.39 ක් දෙපාර්තමේන්තු අරමුදලින් ද ගෙවා තිබුණි. මෙසේ රු.මිලියන 12.39 ක් දෙපාර්තමේන්තු අරමුදලින් සේවාවක් ලබා නොගෙන ගෙවා තිබීම අනාර්ථික ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය. | රජයේ අරමුදලින් සිදුකරන ගෙවීම්වලට ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභයන් අත්පත් කරගැනීමට නිලධාරීන්ගේ අවධානය යොමු කළ යුතුවීම. | මෙම රු.මිලියන 12.39 ක මුදල NSSL Global ආයතනයට ගෙවා අත්තේ 2018 මැයි 18 දිනැති කැබිනට් පත්‍රිකා අංක 18/1053/825/002 හි අයිතම 69 යටතේ අමතර ගෙවීම් සඳහා ලබාදුන් අනුමැතිය මතය.<br>NSSL Global ආයතනයේ සේවය සතුටුදායක නොවූ බැවින් 2018 ජුනි 07 දින ගිවිසුමක් මගින් මෙම කාර්යය E3X Global pvt Ltd වෙත භාරදී ඇත. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>--------------------- | **නිර්දේශය**<br>---------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>-------------------- |
|---|---|---|
| (අ) යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත්තුව පරිපාලනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) විස්තරාත්මක ලංසු ඇගයීම් වාර්තාවේ සඳහන් නිර්දේශිත ලංසුකරු ඉල්ලා ඇති වැට් බදු ප්‍රතිශතය සියයට 12 ක් වුවත් ගෙවීම් කිරීමේ දී එය සියයට 15 ක් ලෙස ගණනය කර ගෙවීම නිසා අනුමැතියකින් තොරව වැට් බදු ලෙස රු.මිලියන 1.55 ක් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් සඳහා අනුමැතිය ලැබී ඇද්දැයි පරීක්ෂා කර අදාල ගෙවීම් කළයුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| (ii) ගිවිසුම්ගත කාලය ඉක්මවා දින 261 ක් ගත කර ඇතත් වැඩ අවසන් කර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව දිනකට රු.70,600 ක් බැගින් ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව රජයට අයවිය යුතු මුදල් අයකර ගත යුතුවීම. | -එම- |
| (iii) ගිවිසුමේ 28.2, 32.1, 36.2, 39.2,39.6 හා 40.5 යන කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා මූලික කොන්ත්‍රාත් මිලෙන් සියයට 10 ක් ඉක්මවා ගෙවා තිබුණු රු.මිලියන 6.95 ක් වූ විචලන වටිනාකම මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයට පාඩු සිදුකිරීමේ දී මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | -එම- |
| (ආ) 2018 වර්ෂය අවසානයට දිස්ත්‍රික් ධීවර කාර්යාල 10 ක ඉතිරි ලොග් පොත් තොගය 2297 ක් වූ අතර ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ පැවති තොගය 690 ක් විය. ඒ අනුව ඉතිරි පොත් තොගයේ එකතුව 2987ක් වූ අතර ආසන්න වශයෙන් එහි වටිනාකම රු.මිලියන 3.88 ක් විය. විද්‍යුත් ටැබ්ලට් මිලදී ගැනීමට සාපේක්ෂව මෙම ලොග් පොත් මුද්‍රණය අඩුකළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවිය. | ලිපිද්‍රව්‍ය භාවිතය අවම කිරීමට කටයුතු කළ යුතුවීම. | -එම- |
| (ඇ) රු.960,000 ක් වූ නියමු බලපත්‍ර 8000 ක් මුද්‍රණය කිරිම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ධීවර කාර්යාල මට්ටමින් අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීමකින් තොරව නියමු බලපත්‍ර මුද්‍රණය කර තිබීම. | අවශ්‍යතාව හඳුනාගෙන මිල දී ගැනීම් සිදුකළ යුතුවීම. | -එම- |
| (ii) | නියමු බලපත්‍ර ප්‍රධාන ගබඩාව වෙත භාර දී භාණ්ඩ ලැබීම් පිළිබඳ සනාථ කර නොගෙන ඉන්වොයිස් සඳහා රු.292,050 ක ගෙවා තිබීම. | මුදල් රෙගුලාසි 237 ට අනුව භාණ්ඩ ලැබීම තහවුරු කරගෙන ගෙවීම් සිදුකළ යුතුවීම. | -එම- |
| (iii) | බලපත්‍ර දිස්ත්‍රික් ධීවර කාර්යාල වෙත බෙදාහැරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම. | භාණ්ඩ ලබාගැනීමේ දී හා බෙදාහැරීමේ දී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුවීම. | -එම- |

4. **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ආර්ථික වර්ධනය, සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කරගෙන තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ඉලක්කයන් හඳුනාගෙන තිබුණ ද ඒවා ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය කාර්සාධක දර්ශක හා භෞතික සම්පත් කළමනාකරණයට අදාල ක්‍රමවේදයන් සකසා නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේ දී කාර්යසාධක දර්ශක ඇතුළත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති අතර භෞතික සම්පත් හඳුනා ගැනීමටත් කටයුතු කරනු ඇත. |